<u>වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය</u>

# <u>සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026/2027</u>

01. වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා 2026 හා 2027 වර්ෂයන් සඳහා ලියාපදිංචි වීමට කැමති, මින් පෙර අසාදු ලේඛනගත නොවූ පිළිගත් සැපයුම්කරුවන්ගෙන් හා රාජ්‍ය හා රාජ්‍ය අනුබද්ධිත ආයතන වෙතින් 2026.03.30 දින සිට 2026.04.24 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් සහ උපදෙස්

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය සහ වැඩි විස්තර වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ, ගිණුම් අංශය වෙතින් මුද්‍රිත පිටපතක් ලෙස ලබා ගැනීම හෝ වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වන **https://plantation.gov.lk** වෙත පිවිස **Menu → Procurement→ Active Procurement** මගින් අයදුම්පත සහ උපදෙස් පත්‍රිකාව මෘදු පිටපතක් ලෙස බා ගත කළ හැකිය.

03. සේවාවන් සැපයීම

3.1. සියලුම වාහන අලුත්වැඩියා හා නඩත්තු සේවා

I. එන්ජින් හා යාන්ත්‍රික අලුත්වැඩියා කිරීම
II. ටින්කර් තහඩු වැඩ හා පේන්ට් කිරීම
III. වාහන විදුලි පද්ධති කාර්මික සේවාව.
IV. රථ වාහන වායුසමීකරණ සේවාව.
V. ෆයිබර් වැඩ (රථ වාහන සඳහා).
VI. යතුරු පැදි නඩත්තුව හා උපකරණ සැපයීම.
VII. වීල් එලයින්මන්ට් කිරීම හා වීල් බැලන්ස් කිරීම.
VIII. සියලුම වර්ගයේ වාහන කුෂන්, ආසන සහ ආසන කවර සෑදීම, කාපට් ඇතිරීම.
IX. සියලුම වර්ගයේ වාහන වාර සේවා.

3.2. සියලුම වර්ගයේ කාර්යාලීය උපකරණ, පාටිෂන්, කාර්යාලීය විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම

I. වානේ කාර්යාලීය උපකරණ අලුත්වැඩියාව (කබඩ්, මේස, පුටු ආදිය)
II. දැවමය හෝ කෘතිම දැව ආශ්‍රිත කාර්යාලීය උපකරණ අලුත්වැඩියාව (කබඩ්, මේස, පුටු ආදිය)
III. ඇලුමිනියම් පාටිෂන්, දොරවල් ආදිය අලුත්වැඩියාව සහ අවශ්‍යතාවය අනුව වෙනස්කිරීම්
IV. කාර්යාලීය විදුලි උපකරණ (විදුලි කේතල, මිනි බොයිලේරු, විදුලි පංකා, ආදිය)

3.3. පරිගණක, ලැප්ටොප් සහ ඒ ආශ්‍රිත උපාංග නඩත්තු කිරීම අලුත්වැඩියා සේවා සහ අමතර කොටස් සැපයීම.

3.4. සියලුම වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර හා ස්කැනර් නඩත්තු කිරීම, අලුත්වැඩියා සේවා සහ අමතර කොටස් සැපයීම.

3.5. සියලුම වර්ගයේ විද්‍යුත් මාධ්‍යඋපකරණ, විදුලි සන්දේශ උපකරණ හා මෙවලම් නඩත්තු සේවා හා අලුත්වැඩියා කිරීම්, රූපවාහිනී යන්ත්‍ර, ගුවන් විදුලි යන්ත්‍ර, ඩිජිටල් කැමරා, වීඩියෝ කැමරා, CCTV කැමරා හා උපාංග, සංයුක්ත තැටි, DVD, රෙකෝඩරය, ජාලගතකරණ සේවා හා ඒ ආශ්‍රිත උපාංග, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර ශබ්ද වාහිනී පද්ධති හා ආශ්‍රිත උපකරණ, කැමරා ලෙන්ස් ආදිය අලුත්වැඩියාව, නඩත්තු සේවා කිරීම සහ අමතර කොටස්/උපාංග සැපයීම.

04. ලියාපදිංචිය සඳහා ගාස්තු අයකිරීම

4.1. ඉහත 3.1, 3.2, 3.3, 3.4, 3.5 ලෙස වූ ප්‍රධාන අයිතමය සඳහා ලියාපදිංචි වීමට ඒ එක් එක් අයිතමය වෙනුවෙන් එකකට රු.2,000.00 බැගින් වන සේ ලියාපදිංචි වීම සඳහා ආපසු නොගෙවන ලබන මුදලක් අය කරනු ලැබේ. (උදා: 3.1, 3.2 සහ 3.5 යන අයිතමයන් සඳහා ලියාපදිංචි වන්නේ නම් ලියාපදිංචි ගාස්තුව රු6,000.00 ක් වේ). (ප්‍රධාන අයිතම යටතේ දක්වන උප අයිතමයන් සඳහා (i), (ii), (iii),.. ආදී ලෙස වූ වෙන වෙනම ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ)

4.2 **ලියාපදිංචි ගාස්තු**, 'ලේකම් - වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය' නමින් ඇති **නිල බැංකු ගිණුම වන ලංකා බැංකුවෙහි බත්තරමුල්ල ශාඛාවෙහි අංක 0007040714 දරන ගිණුමට බැර කර**, මුදල් තැන්පතු පත්‍රිකාවේ පාරිභෝගික මුල් පිටපත (Customer's Copy of Cash Deposit Slip) අයදුම් පතට ඇමිණිය යුතු වේ.

- **නැතහොත් ලියාපදිංචි ගාස්තු 2026.03.30 දින සිට 2026.04.24 දක්වා සතියේ රාජකාරි දිනයන්වලදී පෙ.ව 9.00 සිට ප.ව 3.00** දක්වා වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ **සරප් වෙත (8 මහල "A" පර්යන්තය) මුදල් ගෙවිය හැක.** මුදල් ගෙවීමේ කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පත්‍රය සමග

ඉදිරිපත් කල යුතු වේ.(මුදල් ගෙවීමේ කුවිතාන්සියේ මුල් පිටපත ඉදිරිපත් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබයි).

<u>සැ.යු</u>

- බැංකු මඟින් මුදල් තැන්පත් කිරීමේදී තැන්පතුවේ අවශ්‍යතාවය යන කොටසේ 'SR-' ලෙස සඳහන් කර අනතුරුව ආයතනයේ නම යොදා මුදල් බැර කිරීම අනිවාර්ය වේ. **(උදා: 'SR- XYZ (Pvt)Ltd')**

- මුදල් ගෙවූ බවට මුදල් තැන්පතු පත්‍රිකාවේ පාරිභෝගික මුල් පිටපත/ මුදල් ගෙවීමේ කුවිතාන්සියේ මුල් පිටපත ඉදිරිපත් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අයදුම්පත් පිරවීමට සහ අයදුම්පත් යොමු කිරීම සඳහා උපදෙස්

5.1 ඉහත 3.1 හා 3.2 හි, අලුත්වැඩියා සහ සේවා කිරීම වෙනුවෙන් ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ,ව්‍යාපාරයේ ස්වභාවය පැහැදිලිව සටහන්ව තිබිය යුතුය. උදා: රථවාහන යාන්ත්‍රික අලුත්වැඩියා, කුෂන් සහ ආසන අලුත්වැඩියා වැඩ, විදුලි පද්ධති කාර්මික සේවාව, වායු සමීකරණ අලුත්වැඩියා, කාර්යාලීය උපකරණ අලුත්වැඩියා, ඇලුමිනියම් පාටිෂන් වර්ක්ස් .. ආදී ලෙස)

5.2 ඉහත අනු අංක යටතේ ඇති ක්ෂේත්‍රයන් සඳහා සුදුසුකම් ඇති ආයතන එම එක් එක් ක්ෂේත්‍රයන් යටතේ ලැයිස්තුගත කෙරෙන අතර, ඉදිරිපත් කරනු ලබන සුදුසුකම් අනුව යම් ආයතනයක් ක්ෂේත්‍රයන් කිහිපයක් හෝ සියල්ල සඳහා වුවද සුදුසුකම් ඇති ආයතනයක් ලෙස ලැයිස්තුගත වීමට අවකාශ ඇත. එසේ වුවද, එම එක් එක් <u>උප ක්ෂේත්‍රයන්</u> සඳහා වෙන වෙනම ලියාපදිංචි ගාස්තු ගෙවීමක් අවශ්‍ය නැත.

5.3 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමග අදාළ (ඉල්ලුම් කර ඇති) ලිපි ලේඛණ කවරයක බහා (ව්‍යාපාරයේ ලියාපදිංචි සහතිකය, VAT ලියාපදිංචි සහතිකය හා මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත/ මුදල් ගෙවීමේ කුවිතාන්සිය අයදුම්පත්‍රයට අමුණා) **2026.04.24** දින ප.ව. 3:00 ට හෝ ඊට ප්‍රථම ලබෙන පරිදි " **සභාපති ප්‍රසම්පාදන කමිටුව (සුළු), වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය, 8 වැනි මහල, සෙත්සිරිපාය - II අදියර, බත්තරමුල්ල** " යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ගෙනවිත් බාර දිය යුතුය.ඉල්ලුම්පත් බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026/2027"** **යනුවෙන්** සඳහන් කල යුතුය.

06. කොන්දේසි

(අ) පහත අවශ්‍යතා සපුරා නොමැති අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ

I. අසම්පූර්ණ අයදුම්පත්‍ර
II. ඉල්ලුම්කරනු ලබන කාණ්ඩයට අදාළව ව්‍යාපාරය ලියාපදිංචි කර ඇති බව සනාථ කරන ලේඛන අමුණා නැති අයදුම්පත්‍ර
III. ව්‍යාපාරයේ ස්වභාවය සහතික කරන ලේඛන, ඉල්ලා ඇති සුදුසුකම් පවතින බව සනාථ කිරීමට ප්‍රමාණවත් ලේඛන අමුණා නැති අයදුම්පත්‍ර
IV. ලියාපදිංචි ගාස්තු ගෙවීම් කර මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත/ මුදල් ගෙවීමේ කුවිතාන්සිය අමුණා නැති අයදුම් පත් ලියාපදිංචිය සඳහා සුදුසුකම් නොලබන අතර, කිසිදු හේතුවක් මත ගෙවන ලද ලියාපදිංචි ගාස්තු මුදල ආපසු නොගෙවනු ලැබේ.

(ආ) ලියාපදිංචි සැපයුම්කරුවෙකු ලෙස රැඳී සිටීමට පහත අවශ්‍යතා සපුරාලිය යුතුවේ.

I. ඉල්ලුම් කළ විට නියමිත කාලසීමාව තුළ මිල ගණන් ඉදිරිපත් කළ යුතු වේ.
II. ඇණවුම් කළ විට නියමිත කාලය තුළ භාණ්ඩ හෝ සේවා සැපයීම සිදුකළ යුතු වේ.
III. සපයන ලබන සේවාව, හෝ ඉදිරිපත් කරන ලද සාම්පල හෝ ලබාදෙන්නා වූ භාණ්ඩ නිසි (ඉල්ලුම් කරනු ලබන ) ප්‍රමිතියෙන් විය යුතුය.

ඉහත කොන්දේසි සපුරාලීමට අසමත් වන සැපයුම්කරුවන්ගේ නම් පූර්ව දැනුම්දීමකින් තොරව ඕනෑම අවස්ථාවක ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමේ බලය වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සතුය.

07. මිල ගණන් කැඳවීම්

I. ලියාපදිංචි සැපයුම්කරුවන් ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, සේවා අවශ්‍යතාවය මත වෙනත් සැපයුම්කරුවන්ගෙන් හෝ දේශීය නියෝජිතයන්යන්ගෙන් (Local Agents) (යන්ත්‍රෝපකරණ/ රථවාහන අමතර කොටස්/ පරිභෝජන ද්‍රව්‍ය හෝ අලුත්වැඩියා/ සේවා සඳහා) මිල ගණන් කැඳවීම, හෝ මිලට ගැනීම සඳහා අයිතිය වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සතුය.

II. තවද හදිසි හෝ විශේෂ අවස්ථාවල, අවශ්‍යතාවය සඳහා සුදුසුකම් ඇති ලියාපදිංචි ආයතන වෙතින් චක්‍රීයව තෝරාගැනීමේ (select through a roster) ක්‍රමවේදය ඔස්සේ තෝරාගත් එක් ආයතනයක් වෙතින් පමණක් සෘජු මිල ගණන් කැඳවා, එම මිල ගණන් සමාලෝචනයෙන් අනතුරුව අදාළ ද්‍රව්‍ය මිලදී ගැනීම හෝ සේවා ලබාගැනීම සඳහා අයිතිය වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සතුය.
වැඩි විස්තර ප්‍රධාන ගණකාධිකාරී(ප්‍රසම්පාදන) දු.ක 0112177779 වෙතින් ලබා ගත හැක.

ලේකම්,
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය,
8 වන මහල
සෙත්සිරිපාය II අදියර,
බත්තරමුල්ල,
2026.03.27